# පළමු වාර පරීක්ෂණය - 2012

## බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය

11ශ්‍රේණිය | පෙරදිග සංගීතය | කාලය :- පැය 2 යි.

නම :- ............................................ ඇ.අංකය :- ............................ පංතිය :- ...........

1. කෝමළ නි ලකුණු කල විට කාෆි රාගයට අයත් ය.

   (i) නි ස/ ම ග රි ස -/ ප නි ස

   (ii) නි ධ ම / ප ග රි/ ස රි ග/ ම ප -

   (iii) ස ධ ප ධ/ ම ප ග ම / නි ධ - ස / - රි ග ම

   (iv) ග ම රි/ ග ප ධ නි/ ස නි ධ/ ප ම ග රි

2. නි ස / ම ග රි / ස - / ප නි ස/ යන ස්වර පාදය අයත් සර්ගම් ගීතයේ අන්තර් ආරම්භය වන්නේ,

   (i) ප ප/ ධ ධ නි/ ස රි/ නි ධ ප

   (ii) ග ම/ ධ නි ස/ රි ස/ නි ධ ප

   (iii) ම ප/ ම ග ම/ ප නි/ ප නි ස

   (iv) ග ග / ප ධ ප / ස -/ ප නි ස

3. ග රි ග රි/ ස රි ස ධ/ - ස - රි/ ග - - - යන ස්වර ඛණ්ඩයට අයත් මධ්‍යලය ගීත පාදය කුමක් ද?

   (i) වන තුවත් පිනන මේ අරුණෝදේ

   (ii) ඇහැළ මහට ඇහැළ ගහක

   (iii) බැබලේ පුර හඳ පෝ දිනේ

   (iv) රාගම හිම්පලාසි රසදේ.

4. දෙවන සමයේ රෑ පූර්ණ ජාති සහ දිනයෙහි තෙවෙනි යාමයෙන් සුගැයෙන යන ලක්‍ෂණ ගීත අයත්වන රාග දෙක වන්නේ, (පිළිවෙලින්)

   (i) හිම්පලාසි- ඛමාජ් (ii) කාෆි - හිම්පලාසි

   (iii) කාෆි - යමන් (iv) භෛරවි - බිලාවල්

5. කාෆි රාගයට අයත් කොටස තෝරන්න.

   (i) රිග රිම ග රි ස- / නිධ පම ගරි ස- (ii) නිස ගම පනි ස / සනි ධප මග රිස

   (iii) සරි ගම පධ නිස / නිධ පම ගරි ස (iv) ගම පධ නිස රිස / නිධ පම ගරි ස -

6. ඨාටය ජාතිය වාදි සංවාදී ගාන සමය ආදී කරුණු ඇතුළත්ව නිර්මාණය වී ඇති ගීත හඳුන්වන්නේ,

(i) සර්ගම් යනුවෙනි. (ii) **මධ්‍යලය** ගීත යනුවෙනි

(iii) ලක්ෂණ ගීත යනුවෙනි (iv) රාග ගීත යනුවෙනි

7. සිතාරය වඩාත් උචිත වන්නේ,

(i) සරළ ගීත වාදනයට (ii) ජන ගී වාදනයට

(iii) ශාස්ත්‍රීය වාදනයට (iv) භජන් ගී වාදනයට

8. ඛ්‍යාල් ගීතයක් ප්‍රධාන වශයෙන් කොටස්

(i) තුනකට බෙදේ (ii) හතරකට බෙදේ

(iii) දෙකකට බෙදේ (iv) නියම කොටසකට නොබෙදේ

9. සුළු තනි තිත විභාග වෙන් වෙන්නේ මාත්‍රා,

(i) දෙකෙන් දෙකට (ii) තුනෙන් තුනට

(iii) දෙක තුන ආකාරයට (iv) හතරෙන් හතරට

10. **තිහායි** මුඛුඩා, චක්‍රධාර් වැනි අංග ඇතුළත් වන්නේ,

(i) සිතාර් වාදනයකයි. (ii) තබ්ලා වාදනයකයි.

(iii) වයලින් වාදනයකයි. (iv) මද්දල් වාදනයකයි.

11. වෙස් මුහුණු පැළඳගෙන රඟපාන නාට්‍ය විශේෂය,

(i) නාඩගම් (ii) කෝළම් (iii) නව නාට්‍ය (iv) නූර්ති

12. සේ ගීයක ලක්ෂණයක් නොවන්නේ,

(i) උගතුන් විසින් රචනා කිරීම (ii) ගී තනු ත්‍රිවිධ සප්තක ඇසුරුකිරීම.

(iii) සරල බස් වහරක් යොදාගෙන තිබීම. (iv) සංකීර්ණ නාද මාලා යොදා ගෙන තිබීම.

13. "ඇහැළ මලින් ගස් පිරිලා බලන්න හරි ලස්සනයි" මේ ගීතය ගායනා කිරීමේ දී ලැබෙන තාලය,

(i) බෙම්ටෝ (ii) දාදරා (iii) ඣප් තාලය (iv) කෙහෙර්වා

14. නි ධ - ප/ ම් ප ග ම්/ ප - - -/ ප ම් ග රි, මෙම සර්ගම් ගීතය අයත් වන රාගය,

(i) **බිලාවත්** (ii) භිම්පලාශ්‍රී (iii) යමන් (iv) කාෆි.

15. කෙහෙර්වා තාලය වාදනය කිරීමට සුදුසු අවනද්ධ භාණ්ඩයකි.

(i) මද්දලය (ii) ඩොල්කිය (iii) තබ්ලාව (iv) ගැටබෙරය

16. තාලය අප්‍රාණික ආඝාතය වන්නේ,

(i) **විෂමග්‍රහ** (ii) සමග්‍රහ (iii) අනුතාල (iv) ඛලිය

17. බමාජ් රාගයේ ආරෝහණයේ වර්ජිත වනුයේ,

(i) නිෂාධය යි. (ii) රිෂභය යි.

(iii) **ගන්ධාරය** යි (iv) ධෛවතය යි.

18. මාත්‍රා ගණන සමාන හින්දුස්ථානි තාල යුගලයකි.

(i) ඛෙම්ටෝ - දාදරා (ii) ත්‍රිතාල් - කෙහෙර්වා

(iii) ලාවණි - කෙහෙර්වා (iv) කෙහෙර්වා - ජප්

19. පහත සඳහන් ගායන ශෛලීන් අතරින් හින්දුස්ථානි ගායනා ශෛලියක් නොවන්නේ,

(i) කව්වාලි (ii) භජන් (iii) ඛ්‍යාල් (iv) ප්‍රශස්ති

20. සර්ගම් ගීත පිළිබඳ වඩාත් උචිත ප්‍රකාශය වන්නේ,

(i) රාගයේ ස්වරූපය දක්වන ස්වර රචනාවකි.

(ii) සරිගම යන ස්වර හතර පමණක් ප්‍රබන්ධ ඇතුළත් ය.

(iii) ස්වභාව **සෞන්දර්ය** පිළිබඳ ප්‍රබන්ධ ඇතුළත්ය.

(iv) රාගයේ ස්වරූප ගීතයෙන් කියවෙන ප්‍රබන්ධයන් ය.

21. 1 2 3 4
/සඳවති/හිනැහෙන/ වා S S හි /නා S වී S මෙම මධ්‍යලය ගී පාදයේ සමග්‍රහය (X) යන තාල ස්ථානය පිහිටා ඇත්තේ,

(i) පළමුවැනි විභාගයේ මුල් මාත්‍රාව මත (ii) දෙවැනි විභාගයේ මුල් මාත්‍රාව මත

(iii) තෙවැනි විභාගයේ මුල් මාත්‍රාව මත (iv) සිව්වැනි විභාගයේ මුල් මාත්‍රාව මත

22. "ස ස ග --/ රි රි ම -/ ග ග ප -/ ම ධ ප -"
බැතිනා S / සිරිපාS / කරුණාS / කරනාS මෙම ස්වරස්ථාන ගී පාදයේ දෙවැනි ස්වර පාදය වන්නෙ,

(i) ස - රි -/ ග - ම -/ ග - රි - / ස - - - -

(ii) ම - පම/ ප - ධ ප -/ ධ - නි ධ/ ස - ස -

(iii) ප ප නි - / ධ ධ ස - / නි නි ධ ප/ ධ නි ස -

(iv) ප ම ග රි / **ස නි ධ** -/ ධ නි ස රි / ස - ස් -

23. භෛරවි රාගයේ ගති ලක්ෂණ පෙන්වන සරල ගීතයකි.

(i) මේ සිංහල අපගෙ රටයි (ii) සාධු දන්ත දා

(iii) සැඳෑ අඳුර ලොව ගලන වෙලාවට (iv) කවාලා විලඳ ජාති

24. තබ්ලාව වාදනයේ දී දෑතම උපයෝගී කර ගනිමින් නිපදවා ගත හැකි අක්ෂර දෙකකි.

(i) තත්, තා (ii) තිත්, තා (iii) ධින්, ධා (iv) කිට, තා

25. සංඛ්‍යාතය 256ක් ලෙස දැක්විය හැකි වන්නේ,

(i) මන්ද්‍ර 'ස' ස්වරය සඳහායි. (ii) මධ්‍ය 'ස' ස්වරය සඳහායි

(iii) උච්ච 'ස' ස්වරය සඳහායි. (iv) අති උච්ච 'ස' ස්වරය සඳහායි.

- පහත දැක්වෙන ගී පද ආශ්‍රයෙන් 26 සිට 30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**A** - සේවිත පාද සරෝරුහ සන්ජිතයෙන් ඉතා

**B** - රන්රසා සේම වඩන වන් යසා රූප දිලෙන

**C** - කොහොවි යනා හඬ නගනා මියුරු මනා දන සවනා

**D** - ඉපිද එබොසත් නා ලොව වාරෙක

26. නළු ගීතිකා තාලය අයත් වන්නේ ඉහත සඳහන් කිනම් ගී පාදයට ද?

(i) A (ii) B (iii) C (iv) D

27. දවුල ප්‍රධාන වාද්‍ය භාණ්ඩයක් ලෙස යොදාගනු ලබන්නේ කිනම් පැදි සඳහා ද?

(i) A හා B (ii) B හා C (iii) A, B හා C (iv) C හා D

28. මහනුවර යුගය හා සම්බන්ධව දක්නට ලැබුණු ගීතයක කොටසක් වන්නේ,

(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

29. කෝකිල වන්නටම සම්බන්ධ ගී පාදයකි.

(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

30. කලිකාල සර්වඥ පණ්ඩිතයන් විසින් රචනා කොට ඇති ගීතයක කොටසකි.

(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

31. වයලින් පවුලට අයත් ''වියෝලා'' නම් සංගීත භාණ්ඩය සඳහා යොදා ගැනෙන හඬතලය මින් කුමක් ද?

(i) **සොප්‍රානෝ** (ii) ටෙනර් (iii) **ඇල්ටෝ** (iv) බේස්

32. හෙළ / ජා s තික/ අභිමා s / නේ s s s / s s s s මෙම පැදි පාදය,

(i) සමග්‍රහයෙන් ගැයේ (ii) විෂමග්‍රහයෙන්
(iii) අවග්‍රහයෙන් (iv) සමවිෂමග්‍රහයෙන් ගැයේ.

33. ''සබේ විදානේ'' මෙම චරිතය ඇතුළත් රංග සම්ප්‍රදාය වන්නේ,

(i) සොකරි (ii) කෝලම් (iii) නාඩගම් (iv) නූර්ති

34. දාදරා තාලය දෘත ලයෙන් වාදනය වන විට තවත් තාලයක ගති ලක්ෂණ මතුකර පෙන්වයි. එම තාලය වන්නේ,

(i) ත්‍රිතාලයයි. (ii) කෙම්ටෝ තාලයයි.
(iii) කෙහෙර්වා තාලයයි. (iv) දීපචන්දි තාලයයි.

35. නිර්දේශිත රාගයන් අතුරින් එක් රාගයක් ආරෝහණ හා අවරෝහණයේ දී නිෂාදය දෙයාකාරයෙන්ම යොදාගනු ලබයි. එසේ වන්නේ,

(i) යමන් රාගයේ දී (ii) **බිලාවල්** රාගයේ දී
(iii) ඛමාජ් රාගයේ දී (iv) භූපාලි රාගයේ දී

- 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් සපයන්න. (සංගීත භාණ්ඩ 04ක තොරතුරු මෙම වගුවේ දක්වා ඇත.)

| A | B | C | D |
|---|---|---|---|
| ප්‍රචලිත ප්‍රදේශයේ පංජාබ් මෙම භාණ්ඩය ගසල් ශෛලියේ ගීත වලට සහය වාද්‍ය භාණ්ඩයක් ලෙස බහුවල භාවිතා කරන අතර 'ක්වාලම්' නම් කෝට්ටුවකින් වැයේ. | ඇදීමෙන් හා තල්ලු කිරීමෙන් යන දොයකාරයෙන්ම හඬ නිකුත්වන සේ නලා යොදා ඇත. දකුණතින් ස්වර පුවරුවද වමතින් බේස් (BASS) පුවරුවද වාදනය කරයි. | භාණ්ඩ දෙකක මිශ්‍රණයෙන්, බෙංගාලි ප්‍රදේශයේදී ගොඩනැගුණු ප්‍රධාන තත් හතරකින් හා අනුනාද තත් ගණනාවකින් යුක්ත භාණ්ඩයකි. | ප්‍රධාන තත් හතරකින් යුතු මීන්ඩ් හමක්, ජලාවැනි ශිල්ප මත වාදනය කළ හැකියි. අළුව හෙවත් Bow උපකාරී වේ. |

36. සුළගේ ආධාරයෙන් හඬ නිපදවිය හැකි සුෂිර භාණ්ඩයක් ලෙස යොදාගත හැකි භාණ්ඩය වන්නේ කුමක් ද?

(i) **A** භාණ්ඩය (ii) **B** භාණ්ඩය
(iii) **C** භාණ්ඩය (iv) **D** භාණ්ඩය

37. බටහිර සංගීතය සඳහා යොදා නොගන්නා භාණ්ඩ යුගලය වන්නේ,

(i) **A** හා **B** ය. (ii) **A** හා **C** ය.
(iii) **B** හා **C** ය. (iv) **B** හා **D** ය.

38. බටහිර මෙන්ම භාරතීය සංගීතය සඳහා ද යොදාගනු ලබන භාන්ඩයකි.

(i) **A** භාණ්ඩය (ii) **B** භාණ්ඩය
(iii) **C** භාණ්ඩය (iv) **D** භාණ්ඩය

39. තුම්බා යන කොටස අයත් වන භාණ්ඩය වන්නේ,

(i) **A** භාණ්ඩය (ii) **B** භාණ්ඩය
(iii) **C** භාණ්ඩය (iv) **D** භාණ්ඩය

40. පණ්ඩිත් ශිව කුමාර් ශර්මා විසින් ඉන්දියානු ජනප්‍රිය වාදකයකු ලෙස ප්‍රසිද්ධ වූයේ, මෙම භාණ්ඩය වාදනයෙනි.

(i) **A** භාණ්ඩය (ii) **B** භාණ්ඩය
(iii) **C** භාණ්ඩය (iv) **D** භාණ්ඩය

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.

1. වරහන් තුළින් වඩා නිවැරදි පිළිතුරු තෝරා හිස්තැන පුරවන්න.

**(ශාන්ති කර්ම ගීත/ මෙහෙ ගී/ නෙළුම් ගී/ සමාජීය ගී / ප්‍රශස්ති ගී/ ආසාත්මක ගී/ සේ ගී/ ගැමි ගී)**

සිව්පද ආකෘති රැගත් ගීත විශේෂයක් ලෙස (i) .................................................. හා (ii) .................................................. හැඳින්විය හැක. ඒ අතරින් අතිශෝක්ති වර්ණනා, උපමා,රූපක රැගත් ගීත විශේෂයක් ලෙස (iii)..................................................නම් කළ හැක. අර්ථ රසයට වඩා ශබ්ද රසයට මුල් තැන දුන් ගී විශේෂයක් ලෙසත් මුදුප්පදය ගැබ් ව ඇති ගී වර්ගයක් ලෙසත් (iv) .................................................. හඳුන්වා දිය හැක. කාන්තාවන්ට ප්‍රධාන තැනක් දුන් ගීත විශේෂයකි. (v).................................................. ගී සාමූහික කාර්යන්ට උචිත ලෙස රිද්මයානුකූලව ගැයෙන ගීත (vi).................................................. ගණයට වර්ග කර දැක්විය හැක. වෘත්තීය මත ගොඩනැගුණු ගීත. (vii).................................................. ලෙසත් විනෝදාස්වාදය හා සමාජීය අවශ්‍යතා මත ගොඩනැගුණු ගීත (viii).................................................. ලෙසත් බෙදා දක්වා ඇත. (ix).................................................. උඩරට පහතරට හා සබරගමු ලෙස ප්‍රාදේශීය වශයෙන් වෙන් කොට දක්වා ඇත.

2. (i) ''නි රි ස - නි රි ග රි ස'' මෙම ස්වර කාණ්ඩය අයත් රාගය නම් කරන්න.
   (ii) සියලු ස්වර ශුද්ධ වූ ස්වර පහේ රාගය කුමක් ද?
   (iii) වන්නම් , ප්‍රශස්ති මෙරට ව්‍යාප්ත වූයේ කුමන යුගයක ද?
   (iv) භීම්පලාශ්‍රී රාගයේ ආරෝහණ ස්වර ලියන්න.
   (v) 'සඳ දෙවියන්ගේ සඳ ගල ගාවා'' මෙම ගී පදයේ සැඳැස්මත් ගණය කීය ද?

3. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| රාගය | ආරෝහණ | අවරෝහණ | මුඛ්‍යාංග | වාදී | සංවාදී | විශේෂ ලක්ෂණ 2ක් |
|---|---|---|---|---|---|---|
| බිලාවල් | | | | | | |
| යමන් | | | | | | |
| බමාජ් | | | | | | |
| භූපාලි | | | | | | |

4. සොකරි, කෝලම්, නාඩගම් නූර්ති ශ්‍රී ලාංකිකයන්ගේ රස වින්දනයට වඩාත් ගෝචර වූ රංග සම්ප්‍රදායන් වේ.

**(i)** නාඩගම් රංග ශෛලිය පිළිබඳ කෙටි විමසුමක් කරන්න.

**(ii)** නූර්ති ගීතයක මුල් කොටසක් <u>ගීත ස්වර</u> ප්‍රස්ථාර කරන්න.

**(iii)** සොකරි නාට්‍යයේ විශේෂ ලක්ෂණ 04ක් සඳහන් කරන්න.